(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2024 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 20-23 හි සඳහන් සභාපතිතුමාගේ පණිවිඩයේ සිංහල පරිවර්ථනයක් පමණි)

2024 මූල්‍ය වර්ෂය ඔස්සේ අනාගතය ගැන සිතන විට, HNB ඇෂුවරන්ස් (HNBA) PLC හි අඛණ්ඩ ප්‍රගතිය සහ නොසැලෙන ධෛර්යශීලතාවය පිළිබඳ අතිශයින් ආඩම්බරයට පත් වෙමි. ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ජාත්‍යන්තර සහයෝගයන් ඔස්සේ ශ්‍රී ලංකාවේ ආර්ථික වටපිටාව අර්බුදකාරී තත්ත්වයේ සිට ප්‍රකෘති තත්ත්වයට පත් වීම 2024 වසරේ දී ලකුණු වූ අතර එය රටේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට ද හේතු විය. උපායමාර්ගික දූරදර්ශීභාවය සහ ධෛර්යශීලතාවය සමඟින් මෙම විකාශනය වන තත්වයන් තුළ කටයුතු කරමින් අපි අපගේ ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනය පවත්වා ගෙන යෑම සාර්ථක ලෙස සිදු කර ඇති අතර ම ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් අතර අපගේ ස්ථාවරය ශක්තිමත් කර ඇත්තෙමු.

සැලකිය යුතු ආර්ථික අභියෝගයන් මධ්‍යයේ, ශක්තිමත් අයුරින් අපගේ ව්‍යාපාරය පවත්වා ගෙන යෑමේ ආකෘතිය පිළිබඳ ව ඇති විශිෂ්ට සාක්ෂියක් නම් ශ්‍රී ලංකාවේ Fitch 'A' (lka) ශ්‍රේණිගත ජීවිත රක්‍ෂණ ආයතනයක්බවට පත් වීමයි. මීට සමගාමීව HNB General Insurance (HNBGI), ශ්‍රී ලංකාවේ 'A' (lka) ශ්‍රේණිගත සාමාන්‍ය රක්‍ෂණ සමාගම් කිහිපය අතරින් එකක් බවට පත් වීමට සමත් වී තිබේ. තවද, සමාලෝචිත වර්ෂයේදී HNBA සමූහයේ දළ ලිඛිත වාරිකය (GWP) 21% කින් වර්ධනය වූ අතර එය පෙර වසරේ දී රුපියල් බිලියන 18.8 ක අගයේ සිට රුපියල් බිලියන 22.7 ක් දක්වා පරිවර්තනය කර ගැනීමට අපගේ විශිෂ්ට කණ්ඩායමේ සාමූහික ප්‍රයත්නයන්, අපගේ ගනුදෙනුකරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය සහ ගතික ව්‍යාපාරික පරිසරයට අනුවර්තනය වීමේ අපගේ හැකියාව හේතුවෙන් ඉඩ සැලසී තිබේ. සමූහය විසින් පසුගිය වසරට සාපේක්ෂව 7% ක වර්ධනයක් සමඟ රුපියල් බිලියන 1.8ක් ඉක්මවන බදු පසු ලාභයක් වාර්තා කළේය. අපගේ මූලික අරමුණ වන්නේ රටේ සෑම තැනක ම වෙසෙන සියලුම ශ්‍රී ලාංකිකයින්ට පුළුල් හා ප්‍රවේශ විය හැකි රක්ෂණ විසඳුම් ලබා දීමයි. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ සංකල්පයේ පැතිර යාමේ අඩුවක් දැක ගැනීමට ලැබුණ ද දිවයින පුරා විසිරී පැතිරී සිටින සුවහසක් ජනතාවගේ ජීවිතවලට ධනාත්මක බලපෑමක් ඇති කිරීමට මෙය වැදගත් අවස්ථාවක් ලෙස සලකා අපි කටයුතු කරන්නෙමු.

කීර්තිමත් සංවිධානයක්

ජීවිත රක්ෂණ ආයතනයක් ලෙස, අපි හුදෙක් රක්ෂණ ඔප්පු පිරිනැමීමට වඩා වැඩි යමක් සිදු කරන්නෙමු. අපගේ රක්ෂණයන් තුළින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවන්හිදී නොසැලී සිටීමට, දශක ගණනාවක් පුරා කල් පවතින විශ්වාසයක් සහ ආවරණයක් ලබා දෙන්නෙමු. එබැවින්, විශ්වාසය යනු අපගේ ව්‍යාපාරයේ අංගයක් පමණක් නොව, අප ගොඩනැඟී ඇති අත්තිවාරමයි. මෙම විශ්වාසය අපගේ ආයතනික සංස්කෘතිය තුළ ගැඹුරින් කාවැදී ඇති අතර පාරිභෝගිකයන් කේන්ද්‍රීය කොට ගත් රක්ෂණ සේවා සැලසුම් කිරීම, සහ සාධාරණ මිලකරණයන් සහතික කිරීම, හිමිකම් පියවීම්වල අඛණ්ඩතාව පවත්වා ගැනීම, සේවක වෘත්තිමය හැසිරීම් රටාවේ ඉහළම ප්‍රමිතී   පවත්වා ගැනීම, මූල්‍ය වාර්තාකරණයේ සහ අපගේ සියලුම කොටස්කරුවන් සමඟ ගනුදෙනුවල දී පූර්ණ විනිවිදභාවයක් ලබා දීම දක්වා අප ගන්නා සෑම ක්‍රියාමාර්ගයක් කෙරෙහි ම බලපා තිබේ. මෙය අප ක්‍රියාත්මක වන ආකාරයෙහි සැබෑ ස්වරූපයයි. ඊට අමතරව හැටන් නැෂනල් බැංකු සන්නාමයේ උරුමයෙන් ප්‍රතිලාභ ලබන අනුබද්ධිත ආයතනයක් ලෙස, අප ඉහළම ආයතනික වටිනාකම් ආරක්ෂා කරන අතර, තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා සුවිශේෂිත අවධානයක් යොමු කර තිබේ. ඒ අනුව, අපි දැඩි පාලන ප්‍රමිතීන් පවත්වා ගෙන යන අතර ආර්ථික, සමාජීය සහ පාරිසරික වශයෙන් ධනාත්මක බලපෑම් ඇති කිරීමේ ශක්තිමත් හඬක් ලෙස අඛණ්ඩව කටයුතු කරන්නෙමු. සමස්තයක් ලෙස ගත් කල මෙම අංගයන් විසින් අප සෙසු ආයතන අතර විශිෂ්ටත්වයකින් යුතු ව ස්ථානගත කරන අතර විශ්වසනීයත්වයේ ආලෝකයක් ලෙස අපගේ කීර්තිය ස්ථාපිත කරයි. එය අප ආඩම්බරයෙන් පිළිගන්නා වෙනසකි.

අපගේ සාමූහික ප්‍රයත්නයන් සහ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම පිළිබඳ සාක්ෂියක් වශයෙන් වසර පුරා සම්මාන සහ ඇගයීම් රාශියක් ලැබීම ගෞරවයෙන් සනිටුහන් කළ යුතුය. සේවා ඉටු කිරීම සඳහා ඇති විශිෂ්ටතම ආයතනයක් වීම, ප්‍රමුඛතම කාන්තා හිතකාමී සේවා ස්ථානයක් වීම සහ ප්‍රධාන MDRT සුදුසුකම් සපුරා තිබීම ආදිය මෙහි දී පිළිගැනීමට ලක් විය. Global Banking and Finance Review මගින් HNB ඇෂුවරන්ස් සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් යන සමාගම් දෙකම 2024 වසරේ දී පිළිවෙළින් ජීවිත සහ සාමාන්‍ය රක්‍ෂණ කාණ්ඩවල හොඳම Bancassurance නාලිකාවේ රක්‍ෂණ සපයන්නන් ලෙස නම් කර ඇති බව සාඩම්බරයෙන් සඳහන් කරන්නෙමු. Colombo Leadership Academy විසින් සංවිධානය කරන ලද විශිෂ්ටතම කළමනාකරුවන් වෙත සම්මාන පුද කිරීමේ උළෙලේදී අපගේ හිටපු සභාපතිනි රෝස් කුරේ මහත්මිය Hall of Fame වෙත ඇතුළත් වූවාය.

මෙම ජයග්‍රහණ මගින් පෙන්නුම් කරනු ලැබූයේ සමෘද්ධිමත් සහ සර්වග්‍රාහී සේවා ස්ථානයක් නිර්මාණය කිරීම, කැපී පෙනෙන ප්‍රතිඵල ලබා ගැනීම සහ සුවිශේෂී නායකයින් බිහි කිරීම සඳහා අපගේ ඇති කැපවීමයි.

සංකීර්ණ මෙහෙයුම් පරිසරයක් තුල ආයතනය හැසිරවීම

2024 වසරේ දී අප අභියෝග රැසකට මුහුණ දුන් අතර එහි දී, පාරිභෝගික

වියදම් පීඩනයකට ලක් වීම, වියදම් කළ හැකි ආදායම් අඩු වීම මෙන් ම පෞද්ගලික අංශයේ අඩු ණය වර්ධනයක් පැවතීම ආදිය මගින් ඉහළ පෙළේ වර්ධනයක් ඇති කිරීමට අයහපත් ලෙසින් බලපාන සංකීර්ණ මෙහෙයුම් පරිසරයකට මුහුණ දීමට සිදු විය. කලක් පුරා පවතින අඩු පොලී අනුපාතයන් අපගේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කෙරෙහි අභියෝගාත්මක බලපෑමක් වී ඇති අතර ආයෝජන ආදායම කෙරෙහි මෙමගින් ඇති වන බලපෑම් හේතුවෙන් සමස්ත ඉපැයීම් කෙරෙහි සැලකිය යුතු පහත වැටීමක් ඇති කරමින් අද්විතීය පීඩනයක් ඇති කෙරිණ. මෙම බාහිර සාධක විසින් සැලකිය යුතු අභියෝගයක් නිර්මාණය කළ අතර, විනිමය අනුපාතවල සාපේක්ෂ ස්ථාවරත්වය අපගේ වියදම් පදනමට ධනාත්මක ලෙස බලපෑවේය. විශේෂයෙන් අපගේ සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම්වලදී විනිමය අංශයෙන් ලැබූ පාඩු පහත වැටිණ. මෙවැනි අභියෝගකාරී තත්ත්වයන් තිබියදීත් අප ජීවිත රක්ෂණ වාරික වර්ධනයෙන් ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛයන් අතරට පත් වීමට සමත් වූහ. රක්ෂණ ආරක්ෂණයේ වටිනාකම පිළිබඳ පාරිභෝගිකයන්ගේ අවබෝධය මෙයින් ප්‍රදර්ශනය වූ අතර, අඛණ්ඩතා අනුපාත වැඩිදියුණු කිරීමට සහ අපගේ සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වටිනාකම වැඩි කිරීමට ඉඩ සැලසිණ.

අපගේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයද සංකීර්ණ අභියෝගයන් මධ්‍යයෙන් ගමන් කළ අතර, මෝටර් රථ ආනයනය සඳහා අඛණ්ඩව සීමා පැනවීම සහ සෞඛ්‍ය සේවා පිරිවැය ඉහළ යාම අද්විතීය අභියෝගයක් බවට පත් විය. මෙම බාධක මධ්‍යයේ වුවද අපගේ මෝටර් රථ රක්ෂණ කළඹ ප්‍රශංසනීය ලෙසින් 6%ක වර්ධනයක් වාර්තා කළ අතර එය මෙම අංශයේ අප සතු ශක්තිය ඉස්මතු කර දක්වයි. මෝටර් නොවන අංශවල උපාය මාර්ගික ව්‍යාප්තිය හරහා අපගේ සමස්ත කාර්ය සාධනය තවදුරටත් වැඩිදියුණු කර ගැනීමට හැකි වූ අතර ඒවා වඩාත් ලාභදායී වී ඇති බව නිරන්තරයෙන් ඔප්පු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ මෝටර් නොවන සහ සෞඛ්‍යය නොවන අංශ අඛණ්ඩව වෙළඳපල ප්‍රමුඛත්වයට පත් වීමට හැකි වී ඇත. අපගේ දේපල අංශය ශක්තිමත් අයුරින් පැවති අතර අපගේ ආයතනික ව්‍යාපාරය ශක්තිමත්ව පැවතුනි. අනාගතය දෙස බලන විට 2025 වසරේ දී අපගේ ආයතනික ව්‍යාපාරික මාර්ගයේ ශක්තිමත් නැගීමක් අපේක්ෂා කරන්නෙමු.

එපමනක් නොව, අපගේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ විසඳුම්වල ඒකාබද්ධ ශක්තියෙන් අපගේ ගනුදෙනුකරුවන්ට අද්විතීය වටිනාකමක් සැපයීමට හැකි වී ඇති අතර ඉහළම සමාගම් 100 න් බොහොමයක් සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට හැකි වී තිබේ.

පාර්ශවකරුවන්ට වටිනාකම් ලබා දීම

කැපවීම් කෙරෙහි ගරු කිරීමේ අපගේ හැකියාව, සෑම දිනකම අපගේ අරමුණ මූර්තිමත් කරන අපගේ කැපවූ සේවකයින්ගේ උරහිස් මත රඳා පවතී. අඛණ්ඩ හා ඉලක්කගත පුහුණුව, සුදුසු සම්පත්, සාධාරණ ගෙවීම්, සහ සහයෝගී සේවා පරිසරයක් ලබා දීමෙන් අප අපගේ කාර්ය මණ්ඩලය බල ගන්වා ඇති අතර ඒ ඔස්සේ අපගේ ගනුදෙනුකරුවන්ට විශිෂ්ට සේවයක් සහතික කිරීමට පියවර ගෙන ඇත. අපගේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කැපවීම, කුසලතා සහ යොමුව තුළින් අපගේ සාර්ථකත්වය පිටුපස ඇති ශක්තිය පෙන්නුම් කර ඇති අතර අප සේවය කරන ප්‍රජාවන් තුළ අප නිර්මාණය කරන ධනාත්මක බලපෑම බව සහතික කර ඇත.

අපගේ පදනම විශ්වාසය සහ විශ්වසනීයත්වය මත ගොඩනගා ඇති අතර, ගතික නවෝත්පාදනයන් කෙරෙහි අපි කැපවී සිටිමු. අපගේ ගනුදෙනුකරුවන් සඳහා උසස් විසඳුම්, නව නිෂ්පාදන සහ වඩාත් ලාභදායී විකල්ප ලබා දීම සඳහා පෙරළිකාර ක්‍රමවේදයන් ගවේෂණය කරමින් රක්ෂණ ක්ෂේත්‍රය තුළ ඇති සාම්ප්‍රදායික භාවිතයන්ට අඛණ්ඩව අභියෝග කරන්නෙමු. නවෝත්පාදනය අපගේ අඛණ්ඩ යාවත් කාලීන කිරීම් සාර්ථක කර ගැනීමට මෙන් ම අප ආරක්ෂා කරන අය වෙනුවෙන් සේවය කිරීම සඳහා වඩා හොඳ මාර්ග සෙවීමට අවශ්‍ය බලය සපයයි. මෙම නව්‍ය අදහස් යථාර්ථයක් බවට පරිවර්තනය කිරීම සඳහා මෙන් ම අපගේ මූලික පද්ධති නවීකරණය කිරීමට කෘත්‍රිම බුද්ධිය (AI) වැනි නව්‍ය තාක්ෂණයන් වැළඳ ගැනීමට සහ SLFRS 17 ගිණුම්කරණ ප්‍රමිතියට සංක්‍රමණය වීමට අපි සැලකිය යුතු ආයෝජනයන් සිදු කළෙමු.

මෙම ආයෝජන මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා උත්ප්‍රේරකයක් ලැබෙන අතර, නිෂ්පාදන සැලසුම් කිරීමේදී අපගේ නිර්මාණශීලිත්වය මුදාහැරීමට ඉඩක් ලැබෙයි. අපගේ පාරිභෝගික ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා රක්ෂණ වෙළඳපොළ ධනාත්මක ලෙස යාවත් කාලීන කරන නව්‍ය විසඳුම් සංවර්ධනය කිරීමට මෙමගින් අපව බලගන්වයි. මෙම ආයෝජන මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා උත්ප්‍රේරකයක් වන අතර, නිෂ්පාදන සංවර්ධනයේ දී අපගේ නිර්මාණශීලිත්වය මුදාහරින අතර ම අපගේ ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා රක්ෂණ වෙළඳපොළ ධනාත්මක ලෙස නැවුම් කරන නව්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමට අපට බලය ලබා දෙයි.
එපමණක් නොව, වගකිවයුතු සමාගමක් ලෙස අපගේ කාර්යභාරය ලාභ ලැබීමට වඩා බොහෝ සෙයින් විහිදෙන බව අපි විශ්වාස කරන්නෙමු. ආදායම, ස්ථානය හෝ ජනවිකාස කරුණු නොසලකා සෑම ශ්‍රී ලාංකිකයෙකුටම විශ්වාසදායක සහ පුළුල් රක්ෂණ ආරක්ෂාවක් ලබා ගැනීමට අපි දැඩි ලෙස කැපවී සිටිමු. මෙම කැපවීම සමාජයේ සියලුම කොටස්වල අද්විතීය අවශ්‍යතා සපුරාලන පුළුල් නිෂ්පාදන සහ සේවාවන් මාලාවක් ඔස්සේ නව්‍යකරණය කිරීමට සහ සංවර්ධනය කිරීමට අප පොළඹවන අතරම අපගේ ප්‍රජාවේ සෑම සාමාජිකයෙකුටම මූල්‍ය ආරක්ෂාව ළඟා කර ගත හැකි බව සහතික කරයි. සමාජීය වශයෙන් බලපෑම් සහිත සහ මූල්‍යමය වශයෙන් ශක්‍ය විසඳුම් ලබා දීම කෙරෙහි අප අඛණ්ඩ ව අවධානය යොමු කරන්නෙමු.

අපගේ දිගුකාලීන දැක්ම සහ දැනට ප්‍රදර්ශනය කර කාර්ය සාධනය කෙරෙහි සිය කල් පවතින විශ්වාසය තබා ඇති අපගේ කොටස් හිමියන් වෙත අපගේ ඉමහත් ඇගයීම හිමිවේ. ආකර්ශනීය සහ තිරසාර ප්‍රතිලාභ නිරන්තරයෙන් ජනනය කිරීම සහ කොටස් හිමියන්ගේ වටිනාකම වැඩි දියුණු කිරීම කෙරෙහි ස්ථිරව අවධානය යොමු කිරීම අපගේ වගකීම බව අපගේ පිළිගැනීමයි. මෙම කැපවීම ආයතනික පාලනය, අඛණ්ඩතාව සහ මූල්‍ය වගකීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් මගින් තහවුරු වේ. 2024 මූල්‍ය වර්ෂයේදී, අපි අපගේ ආයෝජකයින් සඳහා ඇති වටිනාකම ඉහළ නැංවීමු. එම වසරේ දී අපගේ කොටස් මිල 42% කින් වැඩි වූ අතර, 2023 අවසානයේ රු. 56.60 වූ කොටසක මිළ 2024 වසර අවසානයේ දී රු. 80.10 දක්වා ඉහළ ගියේය. තවද, 2024 සඳහා රු. 3.90 ක ලාභාංශයක් යෝජනා කිරීමට අපි සතුටු වන අතර, එක් එක් කොටස් හිමියාට 48% ක මුළු ප්‍රතිලාභයක් ලබා දීමට අපේක්ෂා කරන්නෙමු.

අඛණ්ඩ කාර්ය සාධනය

2022 වසරේ සිට ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ වර්ධනයක් අත්කර ගනිමින් කැපී පෙනෙන ප්‍රවණතාවක් සලකුණු කිරීමට අපට හැකි වූ අතර එය තවත් දීර්ඝ කර ගනිමින් මේ වසරේ දී ද සුවිශේෂී කාර්ය සාධනයක් වාර්තා කිරීමට හැකි වීම සම්බන්ධයෙන් බෙහෙවින් ආඩම්බරයට පත් වෙමු. මෙම සාර්ථකත්වය උදා කර ගැනීමට හැකි වූයේ අපගේ උපදේශක බෙදාහැරීම් ජාලය සහ ව්‍යාපාර සහයෝගීතා බෙදාහැරීම් ජාලයහරහා අපගේ විකුණුම් බලකායේ කැපවූ උත්සාහයන් සහ අපගේ සමස්ත කණ්ඩායමෙන් ම ලැබුණු සහාය ඔස්සේ ය. අපගේ මූල්‍ය උපායමාර්ගය තුළදී කෙටි කාලීන ලාභවලට වඩා ස්ථාවර වර්ධනයකට ප්‍රමුඛත්වය ලබා දෙන අතර, එය ශ්‍රී ලංකාවේ වඩාත්ම අභියෝගාත්මක වෙළඳපල තත්ත්වයන් තුළ පවා ශක්තිමත්ව රඳා පැවතීමට මනා රුකුලක් විය. පසුගිය වසර හතර තුළ, අප සැලකිය යුතු සාමාන්‍ය වර්ධනයක් අත්කර ගෙන ඇති අතර කණ්ඩායමක් ලෙස ආකර්ෂණීය 20% ක වර්ධනයක් පවත්වා ගැනීමට හැකි වූයේ තිරසාර ව්‍යාපාරික භාවිතයන් සඳහා අපගේ කැපවීම තවදුරටත් ඉස්මතු කරමිනි. අප විසින් වසරින් වසර කොටස් මිල වර්ධනයේ 42% ක ආකර්ෂණීය වර්ධනයක් ලබා ගැනීම සහ 2024 දෙසැම්බර් 31 වන විට රුපියල් බිලියන 38.3 ක් ජීවිත අරමුදලේ වටිනාකම 25% කින් වැඩි වීම මගින් සනාථ විය. එය අපගේ ගනුදෙනුකරුවන් අප කෙරෙහි තබා ඇති කල් පවතින විශ්වාසයට සාක්ෂියකි. තවද, HNBA සහ HNBGI පිළිවෙලින් 379% සහ 219% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් (Capital Adequacy Ratio) සාර්ථකව සටහන් කිරීමට සමත් වූ අතර එය නියාමන අවශ්‍යතාවය වන 120% ට වඩා බෙහෙවින් වැඩි විය.

මෙම ජයග්‍රහණ මගින් ඉස්මතු වූ අදහස වූයේ ආර්ථික අර්බුදය සහ දේශපාලන අවිනිශ්චිතතාවය විසින් එල්ල කරන ලද අභියෝග ජය ගැනීමේ දී අප පෙන්නුම් කළ ප්‍රවීණතාව වන අතර දුෂ්කර කාලවලදී පවා සාර්ථක වීමට අපට ඇති හැකියාව සනාථ විය. අපගේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක වාර්තාවක් 124 පිටුවේ මූල්‍ය ප්‍රාග්ධනය කොටසේ දක්නට ලැබේ.

පාලනය සහ අඛණ්ඩතාව සඳහා මිණුම් ප්‍රමිති සැකසීම

අපගේ පාර්ශවකරුවන් සමඟ විශ්වාසය ගොඩනැගීමට සහ ශක්තිමත් කල් පවතින සබඳතා වර්ධනය කිරීමට මූලික වන ශක්තිමත් ආයතනික පාලනයක් සඳහා ස්ථිර කැපවීමක් පවත්වා ගන්නෙමු. මෙම කැපවීම හුදෙක් නියාමන අනුකූලතාව ඉක්මවා යන අතර අප අපගේ මෙහෙයුම්වල සියලු අංශවලට ක්‍රමවේද භාවිතයන් ඇතුළත් කර ඇත්තෙමු. සංකීර්ණ මෙහෙයුම් පරිසරයන් තුළින් ගමන් කිරීමේ දී අපගේ ශක්තිමත් පාලන රාමු ඉතා වටිනා බව ඔප්පු විය. සමූහයේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ඒවායේ බලපෑම තේරුම් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් වෙමින් පවතින ආර්ථික, නියාමන, දේශපාලනික සහ සමාජීය වර්ධනයන් ක්‍රියාකාරීව නිරීක්ෂණය කළ අතර ඒ ඔස්සේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරන සුදුසු විසඳුම් වර්ධනය කිරීමට අපට හැකි විය. අපගේ අරමුණ වන්නේ හුදෙක් අනුකූල වීම නොව අවශ්‍යතා ඉක්මවා ගොස් සදාචාරාත්මක සහ පාරදෘශ්‍ය ව්‍යාපාරික භාවිතයන් සඳහා ආදර්ශයක් ලෙස ක්‍රියා කිරීමයි.

ඒ අනුව, 2024 ඔක්තෝම්බර් මාසයේදී බලාත්මක වූ ආයතනික පාලනය පිළිබඳ ලැයිස්තුගත කිරීමේ රීති අනුව, අවශ්‍යතාවයන්ට අනුව වෙනස්කම් සිදු කිරීමට අප අනුකූල වී ඇති අතර එහි දී කමිටු ප්‍රතිසංවිධානය කිරීම සහ අවශ්‍යතා පරිදි අධ්‍යක්ෂවරුන් පත් කිරීම ඇතුළුව ක්‍රියාමාර්ග ගැණින. අප සමාගමේ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ ලෙස අශෝක ගුණසේකර මහතා සහ HNB සාමාන්‍ය රක්ෂණහි ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ ලෙස දිනේෂ් ධර්මදාස මහතා පත් කළෙමු. තවද, නාමයෝජනා සහ පාලන කමිටුව ප්‍රතිසංවිධානය කෙරුණු අතර පුළුල් අනුකූලතාවක් සහතික කිරීමේ අභිප්‍රාය ඇතිව එහි සභාපතිත්වය සඳහා ස්වාධීන අධ්‍යක්ෂ ලක්ෂ්මන් සිල්වා මහතා පත් කළෙමු. එපමණක් නොව, ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වන පරිදි අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කළෙමු. තවද, අපගේ මෙහෙයුම්වලට පාරිසරික, සමාජීය සහ පරිපාලන (ESG) අවශ්‍යතා ඒකාබද්ධ කිරීමට අපි කැපවී සිටිමු. අඛණ්ඩතාව සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් සඳහා අපගේ කැපවීම අල්ලස් විරෝධී දූෂණ පනතට අනුකූල වීමට ගෙන ඇති පියවර මගින් අවධාරණය කෙරේ. 2025 මාර්තු මාසයේදී ක්‍රියාත්මක වන දත්ත ආරක්ෂණ පනතට අනුකූල වීම සඳහා ඇති සූදානම සහතික කිරීම සඳහා තෙවන පාර්ශවීය විශේෂඥතාව කල්තියා වර්ග කර ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට අදාළ ව මෙහෙයුම් කමිටු පිහිටුවා ඇත්තෙමු.

ඉහළම පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීමට සහ අපගේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමට අපගේ අඛණ්ඩ කැපවීම පෙන්නුම් කරමින් ව්‍යුහගත

අනුකූලතා වැඩසටහනක් ආරම්භ කළ පළමු සමාගම් කිහිපය අතර අපි ද සිටින්නෙමු.

සාරාංශය සහ ඇගයීම්

ඉදිරිය දෙස බලන විට අපගේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල අනාගතය පිළිබඳව අප වෙත ඇත්තේ ශුභවාදී හැඟීමකි. ඊට හේතුව නම් ධනාත්මක ආර්ථික දර්ශක අපේක්ෂාවන් රැසක් අප හමුවේ තිබීමයි. අපගේ මූලික ව්‍යාපාරය කෙරෙහි අපගේ කැපවීම, නවෝත්පාදනය සඳහා ඇති යොමුව සහ අපගේ පාර්ශවකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීම සඳහා ඇති කැපවීම මගින් බලගන්වන ලද සාර්ථක 2025 වසරක් ගැන අපි විශ්වාසය තබා කටයුතු කරන්නෙමු. අපගේ ජයග්‍රහණ සඳහා මූලික වූ දූරදර්ශී නායකත්වයක් ලබා දුන් සහ බොහෝ කැපවීම් සිදු කළ අපගේ හිටපු සභාපතිනිය වන රෝස් කුරේ මහත්මියට කෘතඥතාව පළ කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නෙමි.

අවසාන වශයෙන්, HNB ඇෂුවරන්ස් සමූහයේ උපායමාර්ගික දිශානතිය සහ ඵලදායීතාව හැඩගැස්වීමේදී තීක්ෂණ බුද්ධියකින් සහ විෂයමූලික දැක්මකින් යුතුව සහයෝගය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල යුගල සඳහා ම මගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. මෙම සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් දෙපලගේ නායකත්වයෙන් යුත් අප්‍රතිහත කැපවීමකින් යුතු කාර්ය මණ්ඩල කණ්ඩායම් දෙක බොහෝ අභියෝග මධ්‍යයේ කැපී පෙනෙන ප්‍රතිඵල ලබා දීම සඳහා වෙහෙස නොබලා කටයුතු කළ සේවය සහ නව්‍ය ප්‍රවේශයකින් සහ අසමසම ආත්ම විශ්වාසයකින් ඉටු කළ මෙහෙය ප්‍රදර්ශනය කර ඇත. අවසන් වශයෙන්, අපගේ මව් බැංකුව වන හැටන් නැෂනල් බැංකුව, අපගේ වටිනා ව්‍යාපාරික හවුල්කරුවන්, ආයෝජකයින් සහ නියාමකයින් විසින් ලබා දෙන අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත මගේ ස්තූතිය පිරිනැමේ. HNB ඇෂුවරන්ස් සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් අනාගතයේදී ශක්තිමත් පදනමක් මත ගොඩනැගී වැඩි සාර්ථකත්වයක් අත්කර ගනිමින් අපගේ සියලුම කොටස්කරුවන්ට තවත් ඉහළ වටිනාකමක් සාක්ෂාත් කර දෙනු ඇති බව මගේ විශ්වාසයයි.

ස්ටුවර්ට් චැප්මන්
සභාපති

කොළඹ, ශ්‍රී ලංකාව.
2025 පෙබරවාරි 18

(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2024 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 31-35 හි සඳහන් ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනයේ සිංහල පරිවර්ථනයක් පමණි)

සැලකිය යුතු ඉහල ආදායම් වර්ධනයක් තුළින් ඉහළ ප්‍රගතියකින් යුත් විශේෂිත වසරක් පිළිබඳව වාර්තා කිරීමට ලැබීම පිළිබඳ සතුටු වන්නෙමි. ලබන වසර අවසන් වන විට ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල සැලකිය යුතු වෙළඳපල කොටසක් අත්පත් කර ගැනීමේ අපගේ උපායමාර්ගික ඉලක්කය සපුරා ගැනීම සඳහා අප ඉතා සාර්ථක ගමනක නිතර වී සිටින අතර එය වසර තුනකට පෙර දියත් කරන ලද අපගේ පස් අවුරුදු මධ්‍ය කාලීන සැලැස්මට අනුකූල වූ ඉලක්කය කරා ළඟා වීමකි. අපගේ ජීවිත රක්ෂණ ව්‍යාපාරය එහි සැලසුම් කළ වර්ධන ඉලක්කය ඉක්මවා ගොස් 26% ක කැපී පෙනෙන වර්ධනයක් අත්කර ගනිමින්, වෙළඳපල සාමාන්‍යයට වඩා බෙහෙවින් ඉහළින් සිටින අතර පසුගිය වසර 4 තුළ 26% ක සාමාන්‍ය වර්ධනයක් පවත්වා ගෙන යෑමට සමත් විය. මෙම ශක්තිමත් වර්ධන ගම්‍යතාව ඔස්සේ 2026 වසර වන විට අපගේ වෙළඳපළ කොටස ළඟා කර ගැනීමේ ඉලක්කය කරා ළඟා වීමට අවශ්‍ය පසුබිම හොඳින් සකස් කර දෙයි. HNB ඇෂුවරන්ස් සමූහය 7% ක වර්ධනයක් සමඟින් රුපියල් මිලියන 1,897 ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර 17% ක කොටස් මත ප්‍රතිලාභ (ROE) ලබා දුන්නේය.

මෙම ප්‍රතිඵල අපගේ දක්ෂ කණ්ඩායමේ කැපවීම සහ හැකියාවන් පිළිබඳ සාක්ෂියක් වන අතර, එමඟින් අපගේ සමාගම වැඩ කිරීමට සුදුසු විශිෂ්ට ස්ථානයක් (Great Place to Work) ලෙස පිළිගැනීමක් ලබා දී ඇති අතර, රටේ කාන්තාවන්ට හිතකර ඉහළම සේවා ස්ථානයක් ලෙස පිළිගැනීමක් ලබමින් ආයතනික ලෝකයේ ප්‍රමුඛයෙකු ලෙස අපගේ ස්ථානය තවදුරටත් තහවුරු කර තිබේ. ෆිච් රේටින්ග්ස් ලංකා විසින් අපගේ රක්ෂණ මූල්‍ය ශක්තිය ශ්‍රේණිගත කිරීම 'A' (lka) ශ්‍රේණිය දක්වා උසස් කිරීම මගින් අපගේ සාර්ථකත්වය තවදුරටත් ශක්තිමත් වේ.

HNB ඇෂුවරන්ස් යනු ශ්‍රී ලංකාවේ 'A' ශ්‍රේණිගත ජීවිත රක්ෂණ සමාගමක් වන අතර HNBGI යනු රට තුළ ක්‍රියාත්මක 'A' ශ්‍රේණිගත සාමාන්‍ය රක්ෂණ සමාගම් කිහිපය අතරින් එකකි.

ගතික වටපිටාවක් තුළ මෙහෙයුම් සිදු කිරීම

2024 වසරේ දී, මෙහෙයුම් පරිසරය තුළ නිරන්තර අවස්ථා මෙන්ම අභියෝග සඳහාද මුහුණ දුන්නේය. මැතිවරණ දෙකක් පැවති වසරක් වූ මෙම වසර තුළ දී වියදම් කළ හැකි ශක්‍යතාව හා පොලී අනුපාතයන්හි අඩුවීම අපගේ ජීවිත රක්ෂණ ව්‍යාපාර අංශය කෙරෙහි බලපෑම් ඇති කරන ලදී.

මෙම සමස්ථ තත්වය සෙමින් ස්ථාවර වන ආර්ථික විචල්‍යයන් මගින් ක්‍රමයෙන් සමනයට පත් විය. සාමාන්‍ය රක්ෂණ (GI) අංශය මුහුණ පෑ අභියෝගයන් වූයේ මෝටර් රථ අංශයට සමස්තයක් ලෙස බලපෑමට ලක්කරමින් පැනවූ නව වාහන සඳහා ආනයන සීමා කිරීම හා සෞඛ්‍ය සේවා පිරිවැය ඉහළ යාම යි. මේ හේතුවෙන් අපගේ සෞඛ්‍ය කළඹවලට ආන්තික වශයෙන් බලපෑවේය. එපමණක් නොව, උපයෝගිතා පිරිවැයේ උච්චාවචනයන් හේතුවෙන් අංශ දෙකම ඉහළ ගිය වියදම් අත්වින්දේය. නියාමන දෘෂ්ටිකෝණයකින් බැලූ විට SLFRS 17 ක්‍රියාත්මක කිරීම ක්ෂේත්‍රයට සැලකිය යුතු අභියෝගයක් වූ නමුත් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ උපදේශකයින් සම්බන්ධ කර ගනිමින් අප විසින් නියමිත කාලය තුල අදාළ කොන්දේසි සපුරාලමින් යහපත් ගමනක නිරත වීමට සමත් වීමු. වසරේ අග භාගයේදී දේශපාලන ස්ථාවරත්වය වැඩිදියුණු වී තිබුණද, සමස්ත ආර්ථික පරිසරය ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍ර සඳහා අභියෝගාත්මකව පැවතින.

උපායමාර්ගික වර්ධනය සහ පරිවර්තනය

ගතික වෙළඳපල තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, අපගේ ශක්තිමත් කාර්ය සාධනය පවත්වා ගැනීම සඳහා ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශ දෙකෙහිම උපායමාර්ගික වැඩසටහන් කරා එළැඹීමට කටයුතු කළෙමු.

ගුණාත්මක සේවක බඳවා ගැනීම්, පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා නම්‍යශීලී සහ අවශ්‍යතාව පරිදි හැඩ ගස්වා ගැනීමට හැකි නිෂ්පාදන සංවර්ධනය කිරීම මෙන් ම අපගේ මෙහෙයුම්වලට තාක්ෂණය ඒකාබද්ධ කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම මෙයට ඇතුළත් වේ. විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් ඇතුළු දුරස්ථව සිටින ගනුදෙනුකරුවන්ට අවැසි සේවා සැපයීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගන්නාලදී. එපමණක් නොව, විශේෂයෙන් අපගේ විකුණුම් බලකාය තුළ ඉහළ දක්ෂතාවන් පෙන්නුම් කරන්නන් රඳවා ගැනීම මෙන්ම ඔවුන්ගේ යහපැවැත්ම සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. අපගේ වැඩිදියුණු කළ පාරිභෝගික සේවාවන් අපගේ සාර්ථකත්වය කෙරෙහි සුවිශාල දායකත්වයක් දැක්වීය. මෙම ඒකාබද්ධ වැඩසටහන් මාලාව සැලකූ විට සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ (GI) ව්‍යාපාර අංශ සඳහා අපගේ කාර්ය සාධනය වෙළඳපල සාමාන්‍යයන් ඉක්මවා යාමට හේතු විය.

අපගේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම ප්‍රධාන කුළුණු තුනක් මත ගොඩනගා ඇත: උපදේශක බෙදාහැරීම් ජාලය සහා ව්‍යාපාර සහයෝගීතා බෙදාහැරීම් ජාලය හරහා අපගේ විකුණුම් බලකාය පුළුල් කිරීම ඔස්සේ වර්ධනය; වැඩිදියුණු කළ පාරිභෝගික අත්දැකීම්; සහ තාක්ෂණික පරිවර්තනය යනු එම කුළුණුයි.

අපගේ මූලික පසු-අන්ත පද්ධති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) ක්‍රියාත්මක කිරීම යන අංශ සඳහා සිදුකරන ලද සැලකිය යුතු ආයෝජනය අපගේ අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ගැනීමට ඉවහල් විය. අපගේ ජීවිත රක්ෂණ ව්‍යාපාර අංශයට අදාළ මූලික පද්ධතිය මේ වන විට සක්‍රීය වන අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශයෙහි පද්ධතිය ද ඉදිරි මාස කිහිපය තුළ සක්‍රීය වීමට නියමිතය. මේ හැරුනු කොට ප්‍රතිරක්ෂණ සහ හිමිකම් සැකසීම විධිමත් කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence-AI) හඳුන්වා දීමට ද කටයුතු කළෙමු. කඩදාසි රහිත ව මෙහෙයුම් කටයුතු සිදු කිරීම පිරිවැය අඩු කිරීම සඳහා ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම හා සම්පූර්ණ කිරීමට ගතවනකාලය අවම කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී.

ජීවිත රක්ෂණය

තවත් විශිෂ්ට කාර්ය සාධනයකින් යුත් වර්ෂයක, 7.5% ක්වූ වෙළඳපල කොටසක් සහතික කර ගනිමින්, 2026 වන විට 10% ක වෙළඳපල කොටසක් ලබා ගැනීමේ අපගේ ප්‍රමුඛතම ඉලක්කය සපුරා ගැනීම සඳහා තවත් පියවරක් ඉදිරියට තබා ඇත්තෙමු. අපගේ සාර්ථකත්වයට හේතු වූයේ ඉතා තරඟකාරී වටපිටාවක් තුළ තිරසාර වර්ධනයක් සඳහා කැපවීම් සිදු කරමින් ඉතා සූක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ගයන්ය.

අපගේ උපාය මාර්ගයේ මූලික අංගයක් වූයේ අඩු මිල ගණන් යටතේ ඉහළ පරිමාවක් ළඟා කර ගැනීමට වඩා පුළුල් පාරිභෝගික පදනමක් සඳහා සුවිශේෂී වූත් වටිනාකම් මත පදනම් වූත් නිෂ්පාදන ඉදිරිපත් කිරීමයි. මෙම ප්‍රවේශය ඔස්සේ විවිධ මූල්‍ය පසුබිම්වල ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීමට හැකි වූ අතර අපගේ විසඳුම් වටිනා සහ තරඟකාරී බව සහතික කරන අතරම සෑම කෙනෙකුට ම ළඟා කර ගත හැකි තත්ත්වයක් ඇති කිරීමට අපට ඉඩ සැලසීය.

එයට අමතරව, ශක්තිමත් සහ ස්ථාවර විකිණුම් බලකායක වැදගත්කම තවදුරටත් හඳුනා ගනිමින් රක්ෂණ උපදේශකයන් රඳවා ගැනීම සහා ඉහළ නැංවීම සඳහා සැකසූ වෘත්තීය මාර්ගයක් හඳුන්වාදීම සහ පැහැදිලිව නිශ්චිත ප්‍රගති අවස්ථා සැලසීම සිදුකරන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණ වූයේ ඉහළ පිරිවැටුම් අනුපාතවල අභියෝගයට මුහුණ දීම සහ අපගේ රක්ෂණ උපදේශකයින් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සබඳතා ගොඩනඟා ගැනීමයි. තවද, ජනතාව අතර මූල්‍යමය වශයෙන් අවදානමට ලක්විය හැකි කොටස් සඳහා සහාය වීම අරමුණු කරගත්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය කෙරෙහි ද අපගේ උපායමාර්ගික අවධානය පවත්වා ගත්තෙමු.

අපගේ ‘මයික්‍රෝ ලයිෆ්’ නිෂ්පාදනය 2024 වසරේ දී සැලකිය යුතු ආකර්ෂණයක් ලබා ගත්තේය. මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම සඳහා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ විශාල සමාගම් සඳහා අභිරුචිකරණය කළ රක්ෂණ විසඳුම් ලබා දීමට කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙන් අපි අපගේ ව්‍යාපාර සහයෝගීතා බෙදාහැරීම් ජාලය පුළුල් කළ අතර හැටන් නැෂනල් බැංකුව සමඟ අපගේ පවතින සම්බන්ධතාවය තවත් ශක්තිමත් කළෙමු.

මීට අමතරව, අපගේ ජීවිත රක්ෂණ ඔප්පු හරහා ලබා දෙන අපගේ සෞඛ්‍ය අමතර රක්ෂණ ආවරණ වලට අමතරව නව්‍යත්වයන් හඳුන්වා දෙමින් සමූහ සෞඛ්‍ය රක්ෂණ විසඳුම් ද දියත් කළෙමු. මෙම නව දීමනාව සැලකිය යුතු අවධානයක් දිනා ගෙන ඇති අතර අනාගත ව්‍යාපාර වර්ධනයට මඟ පෙන්වීම සහ ඉදිරි වසරවලදී අපගේ ලාභදායිතාවයට ධනාත්මක ලෙස දායක වීම සඳහා උපායමාර්ගිකව ස්ථානගත කර ඇත.

සාමාන්‍ය රක්ෂණය

2019 වසරේ දී පාස්කු බෝම්බ ප්‍රහාරය, වසංගතය සහ ආර්ථික අර්බුදය වැනි සිදුවීම්වලින් නිරන්තර අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය සාර්ව ආර්ථික පරිසරයේ සැලකිය යුතු බලපෑමට ලක්ව ඇත. වාහන ආනයනය සීමා වීම මෙන් ම පාරිභෝගික වියදම් අඩුවීම හේතුවෙන් රටේ මෝටර් රථ රක්ෂණ අංශයේ කාර්ය සාධනය පසුබෑමක් ඇති විය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරිභෝගික සේවය වැඩි දියුණු කිරීම සඳහා වූ නව්‍ය තාක්‍ෂණ උපාය මාර්ග සහ නිශ්චිත පාරිභෝගික ගැටළු කල්තියා හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා ඉලක්කගත ප්‍රවේශයක් මගින් HNBGI මේ වන විට උපායමාර්ගිකව රක්ෂණ ක්ෂේත්‍රය තුළ පෙරමුණට පැමිණීමට සමත් වී ඇත.

2024 මූල්‍ය වර්ෂය අවසන් වන විට 7% ක වෙළඳපල කොටසක් අත්කර ගනිමින් ප්‍රමුඛ පෙළේ සාමාන්‍ය රක්ෂණ සමාගමක් බවට පත්වීමේ ප්‍රගතිය වේගවත් කළ සමාගම, පාරිභෝගික කැමැත්ත පුළුල් වශයෙන් ලබා ගැනීමේ වැඩසටහනක් සහ ප්‍රවේශ්‍යතාව සහ පාරිභෝගික සේවය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්කම් හතරකින් යුත් නව ක්ෂණික ඇමතුම් අංකයක් දියත් කිරීම ද ප්‍රධාන මුලපිරීම් අතරට ඇතුළත් විය.

එපමණක් නොව, HNBGI කණ්ඩායමේ කැපවීම සහ විශේෂඥතාව මෙන්ම තාක්ෂණික පරිවර්තනය කෙරෙහි උපායමාර්ගික වශයෙන් යොමු වීම සමාගමේ වර්ධනය වේගවත් කිරීමට උපකාරී විය. සමාගම ලෝක මට්ටමේ මූලික රක්ෂණ පද්ධතියක් තුළ ආයෝජනය කර ඇති අතර SLFRS 17 අනුකූලතාවය සහතික කිරීම සඳහා WTW’s ResQ Financial Reporter (FR) පද්ධතිය ක්‍රියාත්මක කළ පළමු දේශීය සාමාන්‍ය රක්ෂණ සමාගම බවට පත්විය. මෙම දියුණුව සමගින් කෘතිම බුද්ධිය, යාන්ත්‍රික ඉගැනුම සහ රොබෝ විද්‍යාව අපගේ මෙහෙයුම්වලට යොදා ගත් අතර මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ මට්ටමින් පවත්වා ගනිමින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම, නව වෙළඳපල අවස්ථා විවෘත

කිරීම සහ තිරසාර වර්ධනයක් අත්කර ගැනීම සිදු විය.

ශක්තිමත් කාර්ය සාධනය

2024 මූල්‍ය වර්ෂයේදී HNBA සමූහය ශක්තිමත් සමස්ත වර්ධනයක් අත්කර ගත්හ. ජීවිත රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය (GWP) 26% කින් ඉහළ ගොස් ඇති අතර එය ක්ෂේත්‍රයේ සාමාන්‍යය වන 20% ඉක්මවා ඇත. මෙයට අනුරක්ෂණ නව ව්‍යාපාරයන්හි (Endowment New Business) 27% ක වර්ධනයක් සහ අලුත් කිරීම්වල (Renewals) 20% ක වර්ධනයක් ඇතුළත් වේ. සාමාන්‍ය රක්ෂණ (GI) අංශය දළ ලිඛිත වාරික තුළ 14% ක වැඩිවීමක් වාර්තා කළ අතර එය මෝටර් රථ නොවන අංශයේ 24% ක වර්ධනයක් සහ මෝටර් රථ අංශයේ 6% ක වර්ධනයක් පෙන්නුම් කළේය. සාමූහිකව, සමූහය 21% ක වර්ධනයක් අත්කර ගත් අතර, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව අනුව, HNBA සහ HNBGI යන දෙකම නියාමන අවශ්‍යතා ඉක්මවා ගියේය. HNBA හි ප්‍රාග්ධන ප්‍රමාණවත් බව අනුපාතය (Capital Adequacy Ratio) 379% ක් වන අතර HNBGI හි 219% ක් වූ අතර එම දෙඅංශය ම ලැබූ ප්‍රතිඵලය නියමිත අගය වූ 120% ට වඩා බෙහෙවින් වැඩි ය.

හිමිකම් සම්බන්ධයෙන් සලකා බලන විට, රක්ෂණ ඔප්පු කොන්දේසි අනුව වලංගු හිමිකම් ලෙස රුපියල් මිලියන 6,783 ක් ගෙවීමට සමූහය කටයුතු කර ඇත. පාරිභෝගික තෘප්තිය සහතික කිරීම සඳහා යම් යම් සාධාරණ තත්වයන් යටතේ රක්ෂණ ඔප්පු කොන්දේසිවලින් පිටත ගෙවන ලද හිමිකම් ද මෙයට ඇතුළත් වේ.

ජීවිත රක්ෂණ

සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, HNBA ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළ අතර, නව ව්‍යාපාර වාරිකවල 27% ක වැඩිවීමක් සහ අලුත් කිරීමේ වාරිකවල 20% ක වැඩිවීමක් අත්කර ගත්තේය. තනි සහ ආයතනික සේවාදායකයින්ගෙන් ලැබෙන දළ ලිඛිත වාරික පිළිවෙලින් 26% සහ 20% කින් වර්ධනය විය. ව්‍යාපාර සහයෝගීතා බෙදාහැරීම් ජාලය තුළ 38% ක වර්ධනයක් සමඟ නව ව්‍යාපාර වාරික වර්ධනය වූ අතර රක්ෂණ උපදේශක ව්‍යාප්තිය 21% කින් වර්ධනය වීමට එය දායක විය. ක්‍රියාකාරී ආයෝජන උපාය මාර්ගයක් අනුගමනය කිරීම හේතුවෙන් ආයෝජන ආදායමේ 8% ක වර්ධනයක් ලකුණු වූ අතර එය රුපියල් මිලියන 6,914 ක් විය. කළමනාකාරිත්වයේ අධීක්ෂණය යටතේ ඇති අරමුදල් ප්‍රමාණය 26% කින් වැඩි විය.

HNBA හි ශුද්ධ ප්‍රතිලාභ සහ ගෙවන ලද හිමිකම් රුපියල් මිලියන 2,995 දක්වා ඉහළ ගියේය. 20% ක දළ ලිඛිත වාරික වර්ධනයක් පිළිබිඹු කරමින් වැඩි වූ ප්‍රාරක්ෂනය සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය රුපියල් මිලියන 2,466ක් දක්වා ළඟා විය. තොරතුරු තාක්ෂණ ආශ්‍රිත මෘදුකාංග සහ යටිතල පහසුකම්වල ආයෝජන හේතුවෙන් ඉහළ මෙහෙයුම් වියදමක් වාර්තා කර තිබියදීත්, HNBA බදු ගෙවීමට පෙර රුපියල් මිලියන 2,358 ක ලාභයක් සහ රුපියල් මිලියන 1,657 ක බදු ගෙවීමෙන් පසු ලාභයක් අත්කර ගත්තේය. එය වසර සඳහා 3% ක වර්ධනයක් පෙන්නුම් කිරීමකි. ජීවිත රක්ෂණ ව්‍යාපාරයට පීඩනයක් ඇති කළ අඩු පොලී අනුපාත හේතුවෙන් කොටස් හිමියන්ගේ අරමුදල්වල ආයෝජන ආදායම මෙන්ම ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ ඇති වූ අතිරික්තය වැඩිවීම මෙම වර්ධනයට ඉවහල් විය. ප්‍රධාන වශයෙන් මූල්‍ය ආයෝජන වැඩිවීම හේතුවෙන් මුළු වත්කම් 24% කින් වර්ධනය වී එය රුපියල් මිලියන 53,404 ක් ලෙස සටහන් විය. වසර අවසානයේදී පත් කරන ලද රක්ෂණ ජීවගනකඥවරයා විසින් නිර්දේශ කරන ලද පරිදි රුපියල් මිලියන 1,350 ක අතිරික්තය කොටස් හිමියන්ට මාරු කිරීමෙන් පසු මුළු ජීවිත රක්ෂණ කොන්ත්‍රාත් වගකීම් 25% කින් වර්ධනය වී රුපියල් මිලියන 38,648 ක් බවට පත් විය

සාමාන්‍ය රක්ෂණය

මුහුදු, ගිනි සහ ඉංජිනේරු රක්ෂණ ක්ෂේත්‍රයේ ශක්තිමත් ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෝටර් රථ නොවන අංශය 24% ක වර්ධනයක් වාර්තා කළ අතර එය පිළිවෙලින් 166% සහ 27% කි. වාහන ආනයන සීමාවන් නොතකා, සමාගම මෝටර් රථ රක්ෂණ ක්ෂේත්‍රයේ 6% ක වර්ධනයක් සහ සෞඛ්‍යය රක්ෂණ ක්ෂේත්‍රයේ 21% ක වර්ධනයක් අත්කර ගත්තේය. මෙම තත්ත්වය ඔස්සේ නව වෙළඳපල සහ නව අංශ වෙත ව්‍යාප්ත කිරීමට දරන උත්සාහයේ ඵලදායීතාවයක් පෙන්නුම් කරයි.

බහු-නාලිකා උපායමාර්ගය ඉතා ඵලදායී බව ඔප්පු වූ අතර, තැරැව්කාර නාලිකාව (19%ක වර්ධනය), නියෝජිත නාලිකාව (34%ක වර්ධනය) සහ HNB නාලිකාව (6%ක වර්ධනය) වෙතින් ශක්තිමත් දායකත්වයක් සහ අනෙකුත් නාලිකා වලින් 28% ක කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. මෙම විවිධ නාලිකා HNBGI හට පුළුල් පරාසයක ගනුදෙනුකරුවන් වෙත ඵලදායී ලෙස ළඟා වීමට අවකාශය සලසා දී ඇත.

HNBGI හි මුළු හිමිකම් 7% කින්, රුපියල් මිලියන 3,704 ක් දක්වා අඩු වූ අතර, අත්පත් කර ගැනීමේ පිරිවැය, තොරතුරු තාක්ෂණ ආශ්‍රිත පිරිවැය සහ කාර්ය මණ්ඩල පිරිවැය හේතුවෙන් මුළු පිරිවැය 11% කින්, රුපියල් මිලියන 2,627 දක්වා ඉහළ ගියේය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, HNBGI ලාභදායිතාවය ආකර්ෂණීය වර්ධනයක් අත්කර ගත් අතර, බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 240 ක් වූ අතර එය 59% ක වැඩිවීමක් පිළිබිඹු කරයි. පොලී අනුපාත අඩු කිරීම, විනිමය උච්චාවචනයන්ගේ බලපෑම සහ ප්‍රතිරක්ෂණ වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ඇති වූ පීඩනය මධ්‍යයේ වුවද මෙම ජයග්‍රහණය ලබා ඇත. රෙගුලාසිවලට අනුව ජාතික රක්ෂණ භාර අරමුදලට මෝටර් රථ අංශයේ 100%ක, වර්ජන-කැරලි සහ සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදයට (SRCC & TC) අදාළ වාරික ගෙවීම හේතුවෙන් ඉහළ ප්‍රතිරක්ෂණ පිරිවැයක් ඇති විය.

මුළු වත්කම් 7% කින් වර්ධනය වී රුපියල් මිලියන 10,229 ක් වූ අතර, එයට ප්‍රධාන වශයෙන් මූල්‍ය ආයෝජන හේතු විය. සාමාන්‍ය

රක්ෂණ ගිවිසුම් වගකීම් 4% කින් අඩු වී රුපියල් මිලියන 4,507 ක් විය. බොහෝ දුරට වර්ජන-කැරලි සහ සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදයට අදාළ වාරික ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති විය.

නව නිෂ්පාදන සහ පාරිභෝගික කේන්ද්‍රීය විසඳුම්

